# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2365/73 – 2024 ජනවාරි මස 06 වැනි සෙනසුරාදා – 2024.01.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුවිට කෝරළේ උතුරු උඩපත්තුව සුළු කොට්ඨාසයේ, අංක 149 A, මාටුවාගල, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාටුවාගල (අ.ග.පි.325) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක R/KRE/2022/104 සහ 2022.08.18 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'A' – මාටුවාගල වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0506

උතුරට: මාටුවාගල වත්ත සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය; දකුණට සහ බටහිරට: මාටුවාගල වත්ත.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/11/2021/CEB/264.
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල,
2023 ඔක්තෝබර් මස 30 වැනි දින.

EOG 01 - 0048

1A – G 041196 – 14 (2024/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*